# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2015 පෙබරවාරි මස 18 (බදාදා) දින පෙ.ව. 9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ලක්ෂ්මන් නිපුන ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට

(ප/VI (1) /15/01)

අ) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාසල් වල 2015 වසර සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කරගනු ලැබුවේද?

ආ) එම ඇතුලත් කිරීම්වලට අනුව පාසලක හඳුනාගැනීම සඳහා යොදා ඇති පන්තිවල නම් සහිතව එක් එක් පන්තියේ සිටින ළමුන් ගණන හා ඒ ඒ පන්තියේ සම්පූර්ණ කළ හැකි ඉතිරි පුරප්පාඩු ගණන කොපමණද?

ඇ) පුරප්පාඩු සඳහා, ක්‍රියාන්විත රාජකාරියේ සිටින පවුල්වල ළමුන් ලෙස, අයදුම් කොට අනුමත කර එවා ඇති ළමුන් ගණන, ඒ ඒ පාසලට අනුව කීයද?

ඈ) ඒ අනුව ඒ ඒ පන්තිවලට ඇතුලත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු ගණන කියද?

ඉ) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කවරේද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු ලක්ෂ්මන් නිපුන ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/02)

ආ) බස්නාහිර පළාතේ ඒ ඒ කලාප කාර්යාල වලට අනුව 6,7,8,9,10 හා 11 ශ්‍රේණිවල ලිවීම හා කියවීමට නොහැකි ශිෂ්‍යයින් පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ආ) වාර්තාවට අනුව ලිවීමට හා කියවීමට නොහැකි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

ඇ) මෙම ශ්‍රේණි පරාසයන්හි පසුගිය වසර 5 තුළ පාසල් එම අතරමග නැවතුන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඈ) ඒ කුමන පාසල් වලද? කුමන ශ්‍රේණිවලද?

**03.** ගරු ලක්ෂ්මන් නිපුන ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග,කර්මාන්ත,පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/03)

අ) කෘෂිකර්ම, කෘෂි සංවර්ධන, සුළු වාර්මාර්ග, කර්මාන්ත, පරිසර ඇමතිවරයා V වන පළාත් සභා කාලය තුළ, විෂය භාර අමාත්‍යවරයා වශයෙන් [ගරු උදය ගම්මන්පිල මැතිතුමා] තම ධුරයේ කටයුතු සඳහා විදේශගත වූ අවස්ථා ගණන කීයද?

ආ) විදේශ ගතවූ රට, කුමන දිනවලද?ඒ අනුව විදේශගතව සිටි දින ගණන කවරේද?

ඇ) එකී දිනයන්හි සහභාගී වූ වැඩසටහන් කවරේද?

ඈ) අමාත්‍යවරයා සමග විදේශ සංචාරය වෙනුවෙන් සහභාගී වූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ) ඒ ඒ සංචාර සඳහා වැය කළ මුදල කොපමණද?

ඊ) සංචාරයන් සඳහා වැයකළ මුළු මුදල කොපමණද?

උ) ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ) නොඑසේ නම් ඒ මන්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"*

X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01.** ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:

"නීති විද්‍යාලය මේ වන විට නීතියේ පාලනයෙන් තොරව අත්තනෝමතිකව තීන්දු ගන්නා ආයතනයක් බවට පත්වී ඇත. මෙම ක්ෂේත්‍රයේ ඉහලම වගකීම් දරණ පුද්ගලයන් නීති ශිෂ්‍යයන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කරන තත්වයට පත්ව ඇත. ඒ සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට පැමිණිලි කරන්නට ආයතනයක් නැත. අධිකරණයටද යා නොහැක.

මෙවැනි තත්වයක් තුල සියවසක් සපිරෙන නීති විද්‍යාලයේ අභිමානය ආරක්ෂා කර අනාගත පරපුරට පැවරීමේ වගකීම මේ රජයේ යුතුකමකි. එම නිසා දැඩි අසාධාරණයට ලක්ව සිටින නීති විද්‍යාලයේ සිසුන්ට සාධාරණයක් ඉටු කරමින්, ගරා වැටුන නීති විද්‍යාලය සම්බන්ධයෙන් පවත්නා අර්බුද කඩිනමින් විසදිය යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි "

(යෝ/VI (1) /14/08)

**02.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ, මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමව්පියන්ගෙන් විටින් විට මුදල් අයකිරීම සිදුවේ. පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී මෙන්ම, වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද, දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මෙලෙස මුදල් එකතු කිරීම නිසා, ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත තුළ, පාසල් දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම, (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි "

(යෝ/VI (1) /14/09)

## XI. පොදු කටයුතු

01. ගරු W. A නිමල් ලාන්සා - ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන, සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

'1991 අංක 7 දරන බස්නාහිර පළාතේ මෝටර වාහන ප්‍රඥප්තිය'

'මෝටර වාහන හිඟ ගාස්තුවලට අදාල දඩ මුදල් සඳහා සහන ලබා දීමේ නියෝග'

'2014.09.26 දින බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අනුමැතිය ලද්දාවූද, *1991 අංක 7 දරන බස්නාහිර පළාතේ මෝටර වාහන ප්‍රඥප්තියේ 129 (1) වන වගන්තිය* යටතේ, බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1892/35 දරන හා 2014.12.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, '*මෝටර වාහන හිඟ ගාස්තුවලට අදාළ දඩ මුදල් සඳහා සහන ලබාදීමේ නියෝග*' යනුවෙන් හඳුන්වනු ලබන නියෝග, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන අතර එම නියෝගයන් අනුමත කළ යුතුය.'

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත්

2015.02.06 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.